0139
05793
2020/02
ML/PR

# නර්තන විෂයෙහි ඵලදායිතාව කෙරෙහි පවතින පාසල් ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය මඟින් පවත්වනු ලබන ප්‍රාසංගික කලාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධනයයි.

නම :- කේ.ඩී. ලලිත් කරුණාතිලක

ලි.අංකය :- DD/MP/DA/11/012

අධ්‍යයන වර්ෂය :- 2011

Main_Library_UVPA
057932

පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය

සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය

057932

## අන්තර්ගතය

නර්තන විෂයෙහි ඵලදායීතාව කෙරෙහි පවතින පාසල් ගැටලු නියත පරිධියක් තුළ සිටිමින් විවිධ දෘෂ්ටි පථයන් ඔස්සේ සාකච්ඡා කොට ඇත.

මහියංගණ කලාපයේ තෝරාගත් පාසල් 5 ක් පිළිබඳ ලිඛිත සාධක මෙන්ම සම්මුඛ සාකච්ඡා ආශ්‍රිත සාක්ෂි ඔස්සේ තත් කලාපය පිළිබඳ විශේෂාවධානය යොමුකොට නර්තන විෂයෙහි ඵලදායිතාව පිළිබඳ කරුණු ගවේෂණයෙහි නියැළුණු අතර එහිදී පළමු පරිච්ඡේදයේ දී මෙම නිබන්ධනය සඳහා උපයෝගී කරගන්නා ලද පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳව න්‍යායාත්මකව කරුණු සාකච්ඡා කොට ඇත. දෙවන පරිච්ඡේදයේදී නර්තන විෂය පිළිබඳව හා උපයුක්ත ඵලදායිතා සංකල්පය පිළිබඳ පදානුගත අර්ථ විවරණයන් මෙන්ම න්‍යායාත්මක එළඹුම් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ අතර මෙහිදී නර්තන විෂයට ආබද්ධව ඵලදායිතා සංකල්පයත් ඒ පිළිබඳව නිර්ණය කළ හැකි නිර්ණායකයන් මෙන්ම ඉලක්කගත අභිමතාර්ථයන් පිළිබඳ සාකච්ඡා කොට ඇත. ශ්‍රී ලාංකේය පාසල් අධ්‍යාපන පද්ධතිය තුළ විෂයක් ලෙස නර්තනය ක්‍රියාත්මක වීම මෙන්ම එහි ක්‍රමික වර්ධනය පිළිබඳ සිදුව ඇති විකරණ පිළිබඳවත් මා විසින් තෝරා ගන්නා ලද අධ්‍යාපන කලාපයේ නර්තන විෂය ක්‍රියාත්මක වන අයුරුත් ඊට අනුබද්ධව මෙම විෂය හා සම්බන්ධ ඵලදායිතාව කෙරෙහි පාදක වන මානව හා භෞතික සම්පත් මෙන්ම පාරිසරික සාධක ද පිළිබඳ තෙවන පරිච්ඡේදයේ දී අවධානය යොමු කොට ඇත. එහිදී විෂයික අරමුණු පිළිබඳ අවධානය යොමු කොට ඇත. සිව්වන පරිච්ඡේදයේදී නර්තන විෂයෙහි ඵලදායිතාව ඉහළ නංවාලීමට උපයෝගී කොට ගත හැකි ගුරු කාර්යයන් මෙන්ම මා තෝරා ගන්නා ලද කලාපයේ පාසල් අත්පත් කොටගෙන ඇති පරිසාධන මට්ටම් පාසල් ආශ්‍රිත දත්තයන් ඔස්සේ සාකච්ඡා කොට ඇත. පස්වන පරිච්ඡේදයේදී නර්තන විෂය මගින් පාසල් ආශ්‍රිතව පැනනැගී ඇති ගැටලු මෙන්ම සමස්තයක් ලෙස එය විෂයික ඵලදායිතාවට බලපාන ආකාරය මෙන්ම එම තත්ත්වයන් ව්‍යුපසමනයට උපයෝගී කොටගත හැකි යෝජිත අදහස් මෙන්ම පවතින තත්වයන් ඔස්සේ එළඹිය හැකි නිගමනයන් ද දක්වා ඇත.